**සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත බෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය

## පුරප්පාඩුව - අධ්‍යක්ෂ තනතුර

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ ඉහත දක්වා ඇති තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් බාහිර** : පළමුවැනි හෝ දෙවන ඉහළ පෙළ සිවි වාර්ෂික විද්‍යාවේදී හෝ කෘෂිකර්ම උපාධිය සමග අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය

**පළපුරුද්ද** :

අ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය ලබාගැනීමෙන් අනතුරුව වසර දෙළහක් (12) හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර පහක් (5) ඇතුළත්ව අවම වශයෙන් වසර විස්සක් (20) පර්යේෂණ කටයුතු පිළිබඳ කළමනාකරණ මට්ටමේ සේවා පළපුරුද්ද සමග යහපත් සේවා වාර්තාවක් තිබීම.

සහ

ආ. විවිධ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ විද්‍යාඥයින් හට නායකත්වය සහ මග පෙන්වීමේ හැකියාව සනාථ කළ යුතු වේ. මානව සම්පත් සහ අනෙකුත් සම්පත් මනා ලෙස යෙදවීම හා කළමනාකරණ කාර්යක්ෂමතාවය අමතර සුදුසුකමක් වනු ඇත.

වයස, වැටුප්
**කාණ්ඩය හා**
වැටුප් පරිමාණය : අවුරුදු 40 ට වඩා වැඩි විය යුතු අතර, අවුරුදු 50 ට වඩා අඩු විය යුතුය.

HM 2-3 (රු. 9,8215–2,700 X–රු. 13,0615.00)

ඉහත දක්වා ඇති වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා වෘත්තීය දීමනාව ගෙවනු ලැබේ.

රැකියා විස්තරය : **රබර් පර්යේෂණායතනයේ සියලුම පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්, පරිපාලනය සහ මූල්‍යමය කටයුතු පිළිබඳ වගකීම දැරීම හා කාර්ය මණ්ඩලයට දිරි දෙමින් නායකත්වය සැපයීමේ කාර්ය භාරය උසුලන ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී වේ.**

**තේරීමේ ක්‍රමය** : පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**වෙනත් පහසුකම්** :

1. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 1/2015 හා 1/2015 (1) අනුව රාජකාරී වාහනයක්,
2. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 2/2015 අනුව සන්නිවේදන දීමනාව
3. අගලවත්ත, ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය පරිශ්‍රයෙන් කුලී රහිත, පූර්ණ භාණ්ඩ සහිත බංගලාවක් සහ
4. ආයතනයේ වෛද්‍යාධාර අරමුදලේ නීති රීති ප්‍රකාර වෛද්‍ය ප්‍රතිලාභ ලබාගැනීම සඳහා හිමිකම් ඇත.

**පොදු කොන්දේසි** : අයදුම්කරු විසින් වැටුපෙන් 10% ක් කාර්ය මණ්ඩල අර්ථ සාධක අරමුදල සඳහා දායක කළ යුතු අතර, ආයතනය විසින් 15% දායකත්වයක් සපයනු ලැබේ. සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල වෙනුවෙන් ආයතනය විසින් 3% දායකත්වයක් සපයනු ලැබේ.

**අයදුම්පත් ක්‍රියාවලිය** : පහත දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව තමන් විසින් සකසන ලද අයදුම්පත් 2021.02.17 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කළ යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ, තනතුර සඳහන් කළ යුතු අතර, දැනට රාජ්‍ය සේවයේ / සංස්ථා / මණ්ඩල / පුද්ගලික ආයතනවල සේවය කරන අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත අදාළ ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

1. පුද්ගලික විස්තර, සුදුසුකම් සහ අදාළ පළපුරුද්ද
2. වර්තමාන සහ පසුගිය රැකියාවන්හි තොරතුරු සමග රැකියාව වෙනස් කිරීමට හේතු
3. අයදුම්කරුගේ කුසලතාවයන් සහ දැනුම ඇගයිය හැකි ඥාතින් නොවන නිර්දේශකවරුන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්
4. **උප්පැන්න සහතිකය ඇතුළු සියලු සහතිකවල සහතික කරන ලද පිටපත් අයදුම්පතට ඇමිණීම අනිවාර්ය වේ.**

**සටහන**

අයදුම්පතේ මෘදු පිටපතක් (PDF) 2021.02.17 දිනට පෙර vacancies@rrisl.gov.lk හෝ dirrub@sltnet.lk යන විද්‍යුත් ලිපිනයන්ට යොමු කළ හැක. එහි විෂ ලෙස අධ්‍යක්ෂ තනතුර යනුවෙන් සඳහන් කළ යුතු වේ. කෙසේ වෙතත් ඉහත සඳහන් කර ඇති පරිදි දෘඪ පිටපත ලේඛනගත තැපෑලෙන් යොමු කළ යුතුය.

ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුකාරක වේ. කුමන ආකාරයකින් හෝ මේ සම්බන්ධයෙන් අනිසි බලපෑම් කිරීම ද නුසුදුසුකමක් වනු ඇත.

**සභාපතිනිය, රබර් පර්යේෂණ මණ්ඩලය,**
**තෙලවල පාර, රත්මලාන.**

**2021.01.22**